# "මාස්ටර් සර්" සමඟින් නීලා



සිසිර දිසානායක



**"අහස බලාපන් - පොළොව බලාපන් - පුතුනේ"**
**අහස බලාපන් පුතුනේ ඉර හිනැහෙනවා**
**පොළොව බලාපන් පුතුනේ ලපළු නටනවා !**

හැත්තෑව දශකයේ මුල් භාගයේ සෑම උදෑසනකම ගුවන් විදුලියෙන් ප්‍රචාරය කළ ප්‍රබුද්ධ ගී වැඩසටහන්වල නිතර ප්‍රචාරය වුණු ගීයකි ඒ. ආචාර්ය ප්‍රේමසිරි කේමදාසයන්ගේ නිර්මාණාත්මක මියැසියට මුසු වූ මෛත්‍රී පනාගොඩ නිබන්ධකයානන්ගේ පද පෙළකි ඒ.

"දෑතට වළලු මල් මුතුලැල් මාල පොටයි
යායට එළලූ පුන් කුසුමන් සේ බැබළෙයි."

අපේ ජන ගී ඇසුරින් නිර්මාණය වූ ද දෑතට වළලූ ගීය ඒ දිනවලම ප්‍රචාරය වූ පර්යේෂණාත්මක ගී වැඩසටහන්වල අප සිත් බැඳගත් ගීයක් විය.

තමන්ටම ආවේනික ලයාන්විත, මිහිරි, සිහින් කටහඬක් මෙවන් ගී වෙනුවෙන් දායක කළ ගායන ශිල්පිනය පසුකාලීනව විවිධ ගායන ඉසව් කරා සිය හඬ විහිදුවාලූවාය. "පුංචි සිතේ පුංචි සිනා", "දූ දරු සම්පත් ", "දරුවෝ ඇති අම්මාලා", "බලා හිඳිම්", "සු සැට බරණින් " රිදී කඩුක්කන් වැනි ගීත අතරින් "වියෝ ගී ගැයෙනා හදේ", "අප හමුනොවෙනා", "යාළුවේ හිතින් හඬන්නෙපා", "මේ අවන්හලේ ", " මාස්ටර් සර්" වැනි ගීත කරා සිය හඬ මෙහෙවූයේ එයට යම්කිසි "රොමෑන්ටික්" බවක් ද මුසු කරමින්. ඇය විශාරද නීලා වික්‍රමසිංහ ගායන ශිල්පිනියයි. නිසඟ කුසලතාවයත්, මියුරු හඬක් ලැබීමේ වාසනා මහිමයත්, විශාරදවරියක ලෙස ලද ව්‍යුත්පත්තියත්, එදා මෙදා තුර ගායනයෙන්, ඉගැන්වීමේන් ලද සතත අභ්‍යාසයත් පෙරදැරිව රසික හද අමන්දානන්දයට පත්කළ ඇය වසර 18කට පසුව සිය ගායනයෙන් මෙල්බර්න් නුවරුන් මුණ ගැසෙන්නීය. ඒ මාස්ටර් සර් ගී ප්‍රසංගයෙනි. ඒ වෙනුවෙන් අපි ඇයගේ ඒ මියුරු හඬ දුරකථනයෙන් කැඳවා ගත්තෙමු.

"ඔබ කීවා වගේම එදා ඉඳන් අද වෙනකලුත් අපි බලන්නේ ගායිකාවක් හැටිය හරි යමක් සමාජයට දෙන්නයි" කෙටි සුහද පිළිසඳරකින් පසුව නීලා වික්‍රමසිංහ ගායන ශිල්පිනිය සිය අදහස් දැක්වීමට යොමු වූවාය.

"ඇත්තටම අපි කරන්න හදුපු සේවල් වලින් අයහපත් දෙයක් දීලා නෑ. එහෙම වුණානම් මේ ක්ෂේත්‍රයේ අවුරුදු 48ක් රැඳෙන්න පුළුවන්ද ?" ඇය සිනාසුනාය.

"අපි ඉතින් අළුත් අය ගැනත් හිතන්න හිතන්න ඕන. දැන් හැමෝම ඔය හැත්තෑව, අසූව දශක ගැන කතා කරනවානේ. ඒත් ඒ කාලෙ තමා හොඳම කාලෙ කියලා අපි එතනම රැඳුනොත් මේ ගමන යන්න බෑ. විවිධ සංගීත ශෛලීන්, තාක්ෂණය මේ ක්ෂෙත්‍රයට එකතු වෙනවා. ඉතින් අපිට තියෙන්නේ අපේ අනන්‍යතාවන් රැකගෙන අපේ සංස්කෘතියට ගැලපෙන දේ මේ අළුත් ශිල්ප ක්‍රමත් එක්ක කරගෙන යන එකයි. අපි නැති දවසක මේ දේවල් භාරගන්න පිරිසක් ඉන්න ඕන. ඉතින් ඒ දේට අපේ දේවල් අගේ කරන, අනුගමනය කරන පරපුරක් හදා ගන්න ඕන. පූර්වාදර්ශීන්ව අනුගමනය කලාට කමක් නෑ. අනුකරණය කරන එකයි වැරදි. අනුකරනය කළොත් තමන්ට කියලා අනන්‍යතාවයක් ඇතිවෙන්නේ නෑනේ. අනන්‍යතාවයක් නැතිනම්. අනාගතයකුත් නෑ. මොකද කලින් අය එයාලගේ දේ කරගෙන යනවා. ඒ දේවල් රසිකයොත් විඳිනවා. අනන්‍යතාවයවල් තියෙන අයයි ඕන කරන්නේ.

"මම නම් අලුත් අයටත් නිර්මාණ කරනවා. ඒ වැඩි දෙනෙකුට ඕන ක්ෂණයකින් ජනප්‍රිය වෙන්න. එහෙම මුදල් වියදම් කරගෙන දේවල් කලත් ඒවා තාවකාලිකයි. ඉතින් අපි ගාවට එන ඒ තරුණ තරුණියන්ට අපි මේ දේවල් කියනවා. "හොඳ දේවල් කරමු නේද ?" කිව්වම ඒඅ ය අහනවා."

"ඒත් මාධ්‍යවලට ලොකු වගකීමක් තියෙනවා මේ හරි දේවල්වලට ඉඩ කඩ දීලා සමාජයට ඒවා දායද කරන්න. නමුත් මාධ්‍යකරුවන් ඒ වගකීම පැහැර හරිනවා විතරක් නෙවෙයි; මුදල් අරගෙන වැරදි දේවල් ඉස්මතු කරනවා. අළුත් දක්ෂයෝ ඉන්නවා. ඒත් මේ අයට නිසි පාර කියාදෙන්න කෙනෙක් නෑ. ඉතින් මාධ්‍ය මේ අයව ඩැහැ ගන්නවා. මොනවා උනත් මම හිතන එක දෙයක් තමයි අර කරත්ත රෝදය කැරකෙනවා වාගේ මේ දේවල් කැරකිලා ඇවිත් අර හරි දේ ඉස්මතු වෙන යුගයක් ළඟඳීම එනවාය කියන එක. ඒක දැනටමත් වෙමින් පවතිනවා." විශාරදවරිය පවනට මුදාහල දිගු සුසුමක හඬ තරංග දුරකථනය කම්පනය කළේය.

අපි ඇයගෙන් ඇයගේ විදෙස්ගත රසිකයින් පිළිබඳ අදහමස් විමසුවෙමු.

"ඕනෑම රටක ඉන්න අපේ අය අපට ආදරෙයි. අපි මීට කලින් මෙල්බන් නුවරට ආවේ අවුරුදු 18කට කලින්. ඒ වාරේ මොනෑෂ් සරසවියේ ප්‍රසංග දෙකක් පැවැත්වුවා. ඒ දෙකම අතිශයින්ම සාර්ථක වුණා." ශාලාව පිරී ඉතිරිලා ගියා. ඒ සැරේත් ඊට පස්සේත් අනිත් ප්‍රාන්තවල ප්‍රසංග පැවැත්වුවත් මොනහේතුවකින් හරි මෙල්බන් එන්න ලැබුණේ නෑ. මං විශ්වාස කරනවා මාව රසිකයන් හොඳින් හඳුනනවා. සමහර ප්‍රසංග බැලුවම ගෙදර ගෙනියන්න දෙයක් නෑ. මම ප්‍රසංගය පවත්වන්නේ ප්‍රසංගය පුරාම රසිකයින් එක්ක සම්බන්ධ වෙමින්. ගීයේ වටපිටයාව, නිර්මාණකරුවන් ගැන සිහිපත් කරමින්. ඉතින් විනෝදය, සතුට වගේම හදවතටත් යමක් ලැබේවි ගෙදර ගෙනියන්න."

"මම මේ ප්‍රසංගයේ ගීත 26 ක් විතර ගයනවා. යුග ගීත ගයන්නේ කපිල හේරත්. රසිකයින් ආදරයෙන් වැළඳ ගන්න ගීත වගේම අළුත් ගීතත් කිහිපියක්ම ගයන්න බලාපොරොත්තු වෙනවා. ඉන්ද්‍රජිත් මිරිහාන තමයි සංගීතය මෙහෙයවන්නේ. සමන් කුලරත්නයි මේ ප්‍රසංගය සංවිධානය කරන්නේ. ඉතින් අර කිව්වා වගේම රසවත් අර්ථවත් සැන්දෑවක් වේවි මේ ප්‍රසංගය තියෙන සැන්දෑව."

"කලාකරුවන් යනු සංවේදී පිරිසකි. ඒ නිසාවෙන්ම ඔවුනට තමන්ගේම දැක්මක්ද වෙයි. අර්ථවත් යමක් වෙනුවෙන් පෙනී සිටිනා නීලා වික්‍රමසිංහ විශාරදවරිව අප සමග බොහෝ දේ කතා කළාය.

"මම හැදුන - වැඩුණ, ඉගෙන ගත්ත රට ලෝකයේ ලස්සනම රට. මෙය රටේ පුරවැසියෙක් හැටියට, විශේෂයෙන්ම කලා කාරයෙක් හැටියට මගේ රටට විය යුතු යුතුකම්වලින් බැහැර වෙන්න බැහැ. රටට අයහපතක් වෙනවානම්, රට අගාදයට වයනවානම් මම ඒ වෙුවෙන් පෙනී හිටිනවා."

"ඔබ දන්නවා මම පෝලියෝ රෝගය වැළඳුණ කෙනෙක් බව. මට පෝලියෝ හැදුනේ මාස හයේදී. දන ගාලා තියෙන්නේ එක දවසයි. ඇවිද්දේ අවුරුදු හයේදී විතර. මගෙන් යුනිසෙෆ් ආයතනය ඉල්ලා සිටියා දැන්වීමකට පෙනී සිටින්න. මොකද පැල්පත් වාසී දෙමව්පියෝ පෝලියෝ එන්නත දරුවන්ට දෙන්න බය වුණා. ඉතින් මම මගේ ආභාධිත තත්වය නොසඟවා, ඒ දැන්වීමෙන් දෙමව්පියන්ට ආයාචනා කළා ඒ අයගේ දරුවන්ට මගේ තත්වයට පත්වෙන්න දෙන්න එපා කියලා. ඒ කළේ 1989 දී. 1994 වෙනකොට පෝලියෝ සහමුලින්ම තුරන් වුණ රටක් බවට ලංකාව පත්වුණා. ඉතින් මම හිතනවා මම ඒ වෙලාවේ ජාතික මෙහෙවරක් වෙනුවෙන් පෙනී සිටියා කියලා. ඇයගේ හැඟුම්බර හඬ දුරකථනය තුළින් ඇසුන අන්දම දැනටත් නිම්නාද වන්නා සේ හැඟේ. අපගේ අනාගත පරපුර වෙනුවෙන් සිය දුබල බව ප්‍රබල බවට පත්කර ගනිමින් ඉදිරිපත් වූ නීලා වික්‍රමසිංහ විශාරදවරිය අදටද ඇයගේ ගායනයෙන් හා ගී නිර්මාණකරනයෙන් නොනිම් මෙහෙවරක යෙදෙන්නීය.

අපි ඇයට තුති පුදා සුභ පැතුවෙමු. ඒ ජූලි මස 12 වන ඉරිදා රින්වුඩ් ප්‍රදේශයේ ජෝර්ජ් වුඩ් පර්ෆෝම්ං ආර්ට් සෙන්ටර් ශාලාවේදී පස්වරු 06:00 ට " මාස්ටර් සර්" ප්‍රසංගයේදී ඇයගේ ගායනා සහ පිළිසඳර විඳ ගැනීමේ බලාපොරොත්තුවෙනි.


## SBS සිංහල සේවය

**SBS සිංහල සේවය සඳුදා,**
**අගහරුවාදා, බ්‍රහස්පතින්දා,**
**සිකුරාදා**
**පෙ.ව 11 සිට 12 දක්වා**

සජීවව online අහන්න
www.sbs.com.au/radio - select - SBS radio 2 -Sinhalese

පසුව online අහන්න
www.sbs.com.au/sinhalese
සජීවව on TV - Channel 38

**සජීවව on Radio**
93.1fm - Victoria
97.7fm - NSW
105.5fm - Canberra
106.3fm - SA
93.3fm - QLD
96.9fm - WA

සජීවව හෝ පසුව via Mobile
SBS Radio APP - free download

SBS සිංහල Facebook පිටුව
www.facebook.com/sbssinhalese

කතාකරන්න - (03) 99492169
Fax කරන්න - (03) 99492385
කෙටි පණිවිඩ සඳහා - 042 999 6263
(වැඩසටහන ප්‍රචාරය වන වෙලාවේදී පමණි)



